# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1393 / 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2023

දිනය / திகதி / Date – 07/11/2023 පැය 1110

# මාධ්‍ය නිවේදනය

## 01. සුඛෝපභෝගී ලංගම බස් රථයකට පහරදී අලාභ සිදු කිරීමක් - තණමල්විල පොලිස් ස්ථානය.

2023.11.06 වන දින අළුයම් කාලයේ තණමල්විල පොලිස් වසමේ කුමාරගම හංදිය ආසන්නයේදී තණමල්විල ඩිපොවට අයත් සුඛෝපභෝගී බස් රථයකට පහරදී ඇති බවට ලද තොරතුරක් මත තණමල්විල පොලිසිය මගින් විමර්ශනයක් ආරම්භ කර ඇත.

මෙම සුඛෝපභෝගී බස් රථය බණ්ඩාරවෙල සිට වැල්ලවාය, තණමල්විල හරහා දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඔස්සේ කොළඹ දක්වා ධාවනය වෙමින් තිබිය දී කුමාරගම හංදිය ආසන්නයේදී ඉදිරිපසින් යතුරුපැදියකින් පැමිණි පුද්ගලයින් දෙදෙනෙකුගෙන් පසුපැදිකරු විසින් බස් රථයේ ඉදිරි වාමුවාවට ගල් ප්‍රහාරයක් එල්ලකර පලාගොස් ඇත.

මෙම ගල් ප්‍රහාරය හේතුවෙන් බස් රථයේ ඉදිරි වාමුවාවට හා පැති කණ්නාඩියට හානි සිදුව ඇති අතර, බස් රථයේ රියදුරු හා මගී කාන්තාවක් තුවාල ලබා හම්බන්තොට රෝහලට ඇතුලත් කර නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිටී.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් තණමල්විල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 02. සැකකටයුතු මරණයක් - යාපනය පොලිස් වසම.

2023.11.06 වන දින උදෑසන කාලයේදී යාපනය පොලිස් වසමේ ශිවන්පන්නෙ ප්‍රදේශයේ පිහිටි ලැගුම් හලක නවාතැන් ගෙන සිටි පුද්ගලයෙකු නවාතැන්පලේ ඉදිරි කොරිඩෝවේ වැටී මියගොස් ඇති බවට යාපනය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 61 ක් වන මාරවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම පුද්ගලයා දින කිහිපයකට පෙර මෙම ලැගුම්හලේ ඉහළ මාලයේ පිහිටි කාමරයක නවාතැන් ගෙන සිට ඇති අතර 2023.11.06 වන දින උදෑසන 0600ට පමණ පහළ මාලයේ කොරිඩෝවේ පිහිටි පාපැදි නවතා තිබූ ස්ථානයේ පා පැදි දෙකක් මතට වැටී මෙලෙස මියගොස් සිට ඇත. තවද මරණකරු නවාතැන් ගෙන සිටි කාමරයේ ඔහුගේ අත් අකුරින් ලියන ලද බවට සැකකරන ලිපියක් හමුව ඇති අතර ඔහු විසින් සියදිවි නසා ගන්නා බවත් වෙන කිසිවෙක් මෙයට වගකිව යුතු නොමැති බවටත් එහි සඳහන් කර ඇත.

මෘත ශරීරය යාපනය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සිද්ධිය සම්බන්ධයෙන් යාපනය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - ඉත්තෑපාන පොලිස් වසම.

2023.11.06 වන දින දහවල් කාලයේ ඉත්තෑපාන පොලිස් වසමේ ඇල්පිටිය ලෙව්වන්දුව මාර්ගයේ ලුල්බද්දුව කන්නන්ගර සමාධිය ඉදිරිපිටදී ලෙව්වන්දුව දෙස සිට ඇල්පිටිය දෙසට ධාවනය වූ යතුරුපැදියක් එම දිශාවටම ධාවනය වූ බස් රථයකට ඉස්සර කිරීමට යාමේදී ඉදිරියෙන් පැමිණි තවත් බස් රථයක මුහුණට මුහුණ ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු හා පසුපැදිකරු ඉත්තෑපාන රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා නාගොඩ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 24 ක් වූ මල්වත්ත, පරේගම ලිපිනයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය නාගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් බස් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. ඉත්තෑපාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - කඩවත පොලිස් වසම.

2023.11.06 වන දින දහවල් කාලයේ කඩවත පොලිස් වසමේ කොළඹ නුවර මාර්ගයේ 09 කණුව ප්‍රදේශයේදී මාර්ගය අලුත්වැඩියා කිරීම හේතුවෙන් එහි ඉවත් කරන ලද කාපට් සහ වෙනත් අපද්‍රව්‍ය කොටස් පටවා ගත් ටිපර් රථයක් පිටුපසට ධාවනය කරන අවස්ථාවේදී මාර්ගය හරහා ගමන් කල පදික පුද්ගලයෙකු ගැටී බිම වැටී ටිපර් රථයේ පිටුපස රෝදයට යටවීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පුද්ගලයා රාගම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 59 ක් වූ බියන්විල, කඩවත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය රාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් ටිපර් රථ රියදුරු අත්අඩංගුවට ගෙන කඩවත පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**